ඡන්ද මධ්‍යස්ථානයකට එක්සත් ජාතික පක්ෂයේ ඡන්දපොළ නියෝජිතයකුට ඇතුලුවීමට ඉඩ නොලැබීමේ සිදුවීමක් ද වාර්තා විය. ඊට අමතරව පොළොන්නරුව ගමනා ගමන මණ්ඩලය ආශ්‍රිතව අපේක්ෂකයකු විසින් තම නම හා මනාප අංකය සඳහන් කළ පෑන් බෙදා දුන් බවටද වාර්තා වී ඇත.

තැපැල් ඡන්දය භාවිත කළ දෙවන දිනයේදී අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් ඡන්ද ප්‍රදේශයට අයත් ලාහුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සිවිල් ආරක්ෂක කඳවුරේ පිහිටි තැපැල් ඡන්ද මධ්‍යස්ථානයට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ඇතුළු තවත් අපේක්ෂකයන් දෙදෙනෙක් ඇතුලු වීම සහ පරාක්‍රමපුර සිවිල් බලකායේ දිස්ත්‍රික් කාර්යාලය අසළ අත්පත්‍රිකා බෙදීමක් සිදු කළ බවද වාර්තා විය.

ඉහත සිදුවීම් කිහිපය හැරුණු කොට, බරපතළ සිදුවීම් කිසිවක් වාර්තා නොවූ අතර තැපැල් ඡන්දය පැවැත්වූ ඊයේ දින හා අද දින 70% - 80%ක පමණ ප්‍රමාණයක් තැපැල් ඡන්ද භාවිත කරන ලදි. තැපැල් ඡන්දයේ පළමු දින මෙන්ම දෙවන දින ද සාමකාමී පරිසරයක් පැවති අතර, හඳුනාගත් ඡන්ද මධ්‍යස්ථාන සඳහා විශේෂ නිලධාරීන් යෙදීමට මැතිවරණ කොමසාරිස්වරයා ගනු ලැබූ ක්‍රියාමාර්ග ද මේ සඳහා ඉවහල් වන්නට ඇතැයි අප විශ්වාස කරනු ලබයි. තවද තැපැල් ඡන්ද විමසීම පැවැත්වූ ඊයේ දින හා අද දින තැපැල් ඡන්දය භාවිත නොකළ ඡන්දදායකයන්ට හෙට දිනයේත් ඡන්දය භාවිත කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්තුමා ඉඩකඩ ලබා දෙනු ඇතැයි අප විශ්වාස කරමු.

එමෙන්ම මාර්තු 17 වන දින ඡන්ද විමසීම සඳහා ඉදිරියට තවත් සතියක පමණ කාලයක් පමණක් ඇති හෙයින්, මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය නිදහස් හා සාධාරණ පරිසරය ඉදිරි සතිය තුළත්, මැතිවරණ දිනයේත්, ඊට පසුවත් පවත්වා ගෙන යාමට අවශ්‍ය සහයෝගය මැතිවරණ කොමසාරිස්තුමා ඇතුළු මැතිවරණ දෙපාර්තමේන්තුවට ලබා දීමට පොලිසිය, දේශපාලන පක්ෂ නායකයන්, අපේක්ෂකයන් හා අනෙකුත් සිවිල් සංවිධාන මාධ්‍ය මෙන්ම මහජනතාව ද ක්‍රියාකරනු ඇතැයි අප විශ්වාස කරන අතර ඒ සඳහා ක්‍රියාකරන මෙන් ද කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුතියි

මෙයට විශ්වාසී

රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂ